# රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට

# ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2022 වර්ෂය

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2022 වර්ෂය සඳහා ආධුනිකයින්/ ආධුනිකාවන් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවම සුදුසුකම් :

(අ) වයස :- 2022.05.31 දිනට අවුරුදු 16ත් 25ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයන් 06කල ඕනෑම විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් වීම.

03. පුහුණු පාඨමාලා :- ආධුනික පුහුණුවට තෝරාගනු ලබන ආධුනිකයින්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදාළ කාලසීමාවන්ට යටත්ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා ආධුනිකයින් 25දෙනා බැගින් තෝරා ගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| I. | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පි | - | අවුරුදු 03 (NVQ Level 04) |
| II. | පැස්සුම් ශිල්පි | - | අවුරුදු 03 (NVQ Level 04) |
| III. | විදුලි ශිල්පි (බල) | - | අවුරුදු 03 (NVQ Level 04) |
| IV. | යන්ත්‍ර ශිල්පි (සාමාන්‍ය) | - | අවුරුදු 03 (NVQ Level 04) |

04. අයදුම්පත් : අයදුම්කරුවන් විසින් මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව මි.මී. 297 x 210 (A – 4) ප්‍රමාණයේ සුදු කඩදාසියක පිළියෙළ කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. පාඨමාලා සඳහා තෝරා ගැනීම :

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් සිදු කරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 07 වනි ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම හා සාමාන්‍ය දැනීම පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා පදනම යටතේ ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල දී වැඩිම මුළු ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

06. විභාග මාධ්‍ය : විභාග මාධ්‍යයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේ.

07. විභාග ගාස්තු : මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු.500ක විභාග ගාස්තුවක් අය කෙරේ. සාමාන්‍යාධිකාරී මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176 - 1001 - 2 - 90273313ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ලදුපත අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතු ය.

08. විභාග මධ්‍යස්ථාන : සියලුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ මධ්‍යස්ථානයකදී පමණක් පැවැත්වේ.

09. ගිවිසුම අත්සන් කිරීම : ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදාල කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුවෙන් පසු ආධුනිකයින්ට රැකියා ලබා දීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

11. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිළියෙල කර "නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු හා මානව සම්පත් සංවර්ධන), ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දෙමුල්ල, රතමලාන." වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ " ශ්‍රී.ලං.ජ.දු.කා.අ.ම./" යනුවෙන් සඳහන් කළ යුතුය.

12. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :

අයදුම්පත් 2022.08.29 වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ජේ.අයි.ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2022ජූලි මස 22වැනි දින.
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
කොළඹ 10.